රාහුල විද්‍යාලයීය කොළඹ ආදි ශිෂ්‍ය සංගමයේ - නිල ප්‍රකාශනය

# රාහුල
RAHULA

සිවු මාසිකය - 2018 අගෝස්තු - නොවැම්බර්



# ක්‍රීඩා සමාජයේ වාර්ෂික මහා සභා රැස්වීම





රාහුල විද්‍යාලයීය කොළඹ ආදි ශිෂ්‍ය සංගම් ක්‍රීඩා සමාජයේ 34 වන මහා සභා රැස්වීම සහ 4 වන විධායක කමිටු රැස්වීම 2018 ජූලි මස 21 වනදා තලවතුගොඩ සැනෝරා උත්සව ශාලාවේ දී පැවැත්වුණු අතර එහිදී ආරාධිත අමුත්තන් ලෙස දයා රාමනායක සහ විශේෂ ආරාධිත අමුත්තා ලෙස සුනිල් ජයසිංහ යන මහත්වරුන් සහභාගී විය.

සම්ප්‍රදායනුකූලව පොල්තෙල් පහන දැල්වීමෙන් අනතුරුව මියගිය සාමාජිකයින් සහ ඔවුන් ගේ පවුල් වල සාමාජිකයින සිහිකර විනාඩියක නිශ්ශබ්දතාවක් පවත්වා ඉන් පසුව පැමිණ සිටි සියලුම සාමාජිකයින් එක්ව විදුහල් ගීතය අභිමානයෙන් යුතුව ගයනා කරන ලදී. ක්‍රීඩා සමාජයේ ගරු සභාපති රොහාන් සෝමවංශ මහතාගේ පිළිගැනීමේ කතාව සිදුකිරීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

මෙවර ද කොළඹ ආදි ශිෂ්‍ය සංගමයේ ක්‍රීඩා සමාජයේ ගරු සභාපති ලෙස රොහාන් සෝමවංශ මහතා පත් වූ අතර ගරු ලේකම් ලෙස පී. ඩී. වෙත්තසිංහ මහතා වූයේය.


පසුගිය වසර තුල ක්‍රීඩා සමාජය සිදුකළ විශේෂ ක්‍රියාකාරකම් පිළිබඳව ක්‍රීඩා සමාජයේ ගරු සභාපති රොහාන් සෝමවංශ මහතා විසින් සභාව දැනුවත් කළ අතර ඒ සඳහා කැපවී කටයුතු කළ සියලු ම සාමාජිකයින්ට ක්‍රීඩා සමාජයේ ප්‍රණාමය පුද කරනු ලැබුණි..

ආරාධිත අමුත්තෙකු ලෙස පැමිණි දයා රාමනායක මහතා ට සමරු තිළිණ පිළිගැන්වීම කොළඹ ආදිශිෂ්‍ය සංගමයේ ගරු සභාපති රියර් අද්මිරාල් සරත් මොහොට්ටි මහතා අතින් ද විශේෂ ආරාධිත අමුත්තා වූ සුනිල් ජයසිංහ මහතා ට සමරු තිළිණ පිළිගැන්වීම ක්‍රීඩා සමාජයේ ගරු සභාපති රොහාන් සෝමවංශ මහතා අතින් ද සිදු විය. තවද මෙහිදී විශේෂ සිදුවීමක් ලෙස කොළඹ ආදි ශිෂ්‍ය සංගමය විසින් අප විදුහලේ මලල ක්‍රීඩා කණ්ඩායම වෙනුවෙන් රුපියල් 78000 ක මුදල් පරිත්‍යාග කිරීම ද සිදුවිය. එය ක්‍රීඩා සමාජයේ ගරු ලේකම් පී. ඩී. වෙත්තසිංහ මහතා අතින් පරිත්‍යාග කරනු ලැබුණි..

සියලු දෙනා ම එක්වී ජාතික ගීතය ගයනා කිරීමෙන් පසු මහා සභා රැස්වීම නිමා විය.

ඉන්පසුව සියලු දෙනා ම රාත්‍රී භෝජන සංග්‍රහය ට සහභාගී වීමෙන් අනතුරුව පැමිණ සිටි සංගීත කණ්ඩායම සමග ගායනයෙන් නර්තනයෙන් විනෝද වන්නට වූහ.













# "ගුරු නායකත්වය සහ සතිමත් දෙමාපිය මග පෙන්වීම" යන මැයෙන් දිනක් පුරා අපේ වත්මන් ගුරු භවතුන් සහ දෙමාපියන් උදෙසා පැවති වැඩමුළුව



රාහුල විද්‍යාලයේ කොළඹ ආදී ශිෂ්‍ය සංගමයේ මෙහෙයවීමෙන් ප්‍රවීන කළමණාකාර උපදේශක නාලක හේවාමද්දුම මහතාගේ දායකත්වයෙන් විදුහල්පතිතුමන් ඇතුළු සියයකට අධික ගුරුභවතුන් උදෙසා 2018 ජුනි මස 25 දින උදෑසන සිට දහවල් දක්වා අභියෝග හමුවේ නැගී සිටිමින් ඉලක්ක ජය ගන්නා ප්‍රතිඵලදායක ගුරුවරයෙකු වන්නේ කෙසේද යන මැයෙන් වැඩ මුළුව පැවැත්වුණි. එසේම දෙමාපියන් සඳහා දිවා කාලයේ සිට සතිමත් මග පෙන්වවීම සන්ධ්‍යාව දක්වා දිග හැරුණි .

උදෑසන සිටම වල්ගම හේමමාලි උත්සව ශාලාව විද්‍යාලයිය ධජ වලින් වර්ණවත්වී තිබුණි. කොළඹ ආදි ශිෂ්‍ය සංගමයේ විද්‍යාලයීය සහයෝගීතා කමිටුවේ සාමාජික මොරටුව විශ්ව විද්‍යාලයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්යය ආනන්ද ගමගේ සොහොයුරා විසින් මෙම කාර්යය කොළඹ ශාඛාව වෙනුවෙන් සංවිධානය කළ අතර නාලක හේවාමද්දුම මහතා සහ ඉනෝකා හේවාමද්දුම සොහොයුරිය උදෑසනම උත්සව ශාලාව වෙත පැමිණෙන විටත් ආදි රාහුලයන්ගේ ද සහාය ඇතිව සංවර්ධන කමිටුවේ ගරු ලේකම් උදිත මහනාම සොහොයුරු වැඩ මුළුවට අවශ්‍ය බෙහෝ දෑ සූදානම් කර තිබුණි. ප්‍රැන්සිස් වෙලේගේ ගරු විදුහල්පතිතුමා පැමිණියේ ඉන් අනතුරුවය නියමිතව තිබූ වේලාවටම එනම් 8.30 ට කොළඹ ශාඛාවේ සභාපති රියර් අද්මිරාල් සරත් මොහොට්ටි සොහොයුරා ඇතුළු සම්භාවනීය පිරිස සම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන් දල්වා පන්සිල් සමාදන්වී විද්‍යාලයිය ගීතය අභිමානවත්ව ගැයීමෙන් පසුව විදුහල්පතිතුමාගේ පිළිගැනීමේ කථාවත් අරමුණු පැහැදිලි කිරීමත් සිදුවිය.

ආන්නද ගමගේ සොයුරු විසින් බොහෝ කලක පටන් කොළඹ ආදි ශිෂ්‍ය සංගමය කිරීමට බලාපොරොත්තුවෙන් සිටි මෙම වැඩ මුළුවේ අරමුණු පැහැදිලි කරන ලද්දේ අතිත රාහුලයින් වර්ථමානයේ කළ යුතු වෙනස්වීම් සමග අනාගත ගමන් මග කෙසේ විය යුතුද යන්න එහි ගම්‍ය විය. තවද තරගකාරී විෂය අනුබද්ධිත විභාග රටාවන් වලින් ඔබ්බට ගිය බෞද්ධ දර්ශනය හා කුළුගැන්වුන අපේ සමාජ හර පද්ධතීන් දරුවන්ගේ හදවත් තුලට කැටිකර යහපත් මිනිසුන් බිහිකිරීම රාහුලයේ මුඛ්‍ය පරමාර්ථය බව ගුරුභවතුන් සමග සංවාදාත්මකව ඔහු ඒත්තු ගැන්වීය. එසේම දරුවන්ගේ සහජ දක්‍ෂතා සහ ඔවුන්ගේ කැමැත්ත අනුව අනාගත විෂයයන් තෝරා ගැනීම සිදුවිය යුතුබවද අවධාරණය කරන ලදී.

ගුරුභවතුන් හට තනිපුද්ගලයකු වශයෙන් වටිනා හා වැදගත්වන ස්ථාන අභියෝග තුලින් තිරසාර සාර්ථකත්වය සඳහා ප්‍රමුඛතා ත්‍රිකෝණයට මුල් තැන ලබාදෙමින්, තමා සතුටින් සටිමින්. සිසුන්ගේ ජීවිත සාර්ථකත්වයට සතුටින් මෙහෙයවමින් නායකත්වය දෙන අයුරු නාලක හේවාමද්දුමයින් මැනවින් පහදා දෙන ලද්දේය.

බාහිරින් එල්ලවන අභියෝගවලට සුබවාදී ලෙස හා සැලසුම් සහගතව ප්‍රතිචාර දක්වමින් මිනිසුන් ගේ විශේෂ මෙවලම් හඳුනාගනිමින් විශ්වාසය ගොඩනගාගන්නා අයුරු ඔහු ගුරුභවතුන් හට අවබෝධ කරවීය.

ඉදිරි මාස 12 තුල සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සඳහා මෙම වැඩ මුළුවේ මෙවලම් යොදා ගන්නේ කෙසේද යන අභ්‍යාස, සහ ඉලක්කයන් ගුරුභවතුන් හට තනිවමත් විෂයයන් ශ්‍රේණි සහ අංශ වශයෙන් සාමුහිකවත් අවසන විද්‍යාලයීය වශයෙන් "Action Plans" සෑදීමට යොමුකර ඉන් අනතුරුව මෙහි දෙවන පියවර තැබීමේ අරමුණින් දිවා ආහාරය සමගින් සාකච්ඡා වාරයට යොමුවන ලදී.





කළමණාකාර උපදේශක නාලක හේවාමද්දුම මහතා

දහවන ශ්‍රේණියේ දෙමාපියන් සදහා වැඩ මුළුව ඇරඹුනේ සවස 2.00 ට ය. විදුහල්පතිතුමාගේ පිළිගැනීමේ කථාවත් ආනන්ද ගමගේ සොහොයුරාගේ වැඩ මුළුවේ අරමුණත් නාලක හේවාමද්දුමයන් හදුන්වාදීමෙන් අනතුරුව සතිමත්ව දෙමාපියන් විසින් දරුවනට මග පෙන්වන්නේ කෙසේද යන්න වැඩ මුළුවේ අරමුණයි. උදෑසන සිටි ගුරුභවතුන් බොහෝ දෙනෙකු සවස් වරුවේ වැඩමුළුවට දෙමාපියන් ලෙස සහභාගී වීමද මෙහි සාර්ථක භාවයට කදිම නිදසුනකි.

වැඩ මුළු දෙකම අවසානයේ සහභාගී වූ අයගේ ඉතා යහපත් ප්‍රතිචාර අපට ධෛර්යයක් විය. මෙවන් වැඩ මුළු තව තවත් අවශ්‍ය බවත් බොහෝ දෙනාගේ ඉල්ලීම වූහ. සුරංග රත්නායක ගුරුතුමන් සභාව මෙහෙයවීම ඉතා මැනවින් සිදුකල අතර ශිෂ්‍ය නායකයින් රැසක්ම සංවිධාන කටයුතු වල නියැලිණි. සැදෑ අඳුර ලංවන තෙක්ම වෙහෙසකර නොවූ ප්‍රබෝධවත් වූ මේ සත්කාරයට දවස පුරාවටම ගරු සභාපතිතුමා උප අනුශාසක T. සුරවීර සොයුරා, ගරු භාණ්ඩාගාරික ගාමිණී ජයදේව සොහොයුරා උදිත මහනාම සොහොයුරා ඇතුළු කොළඹ ශාඛාවෙන් මාතර ආදි ශිෂ්‍යයනුත් බොහෝ දෙනෙක් තනිවත් තම ආර්යාවනුත් සමගිනුත් සතුටින් සහභාගී විය.

රාහුල විද්‍යාලයීය කොළඹ ආදි ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කළ මෙහි අනුග්‍රාහකත්වය දරණ ලැබුවෙත් ඔවුන් විසින්ම ය. නාලක හේවාමද්දුමයින් ස්වේච්ඡාවෙන් තම ආදරණීය බිරිඳත් සමගින් තම වටිනාම දිනයක් රහල් විදුහල් මාතාව වෙත පුද කිරීම, ගෞරවයෙන් සටහන් කරන අතර මාධ්‍ය අනුග්‍රහය දැක්වූ සියත TV ආයතනයටත් සහය දුන් සියළු ආදි සොහොයුරන්ටත් රහල් මෑණියන්ගේ සරණ පතමු.

## ජනාධිපති උපදේශක තනතුර ශිරාල් ට



ජනාධිපති සම්බන්ධීකරණ ලේකම්වරයා ලෙස කටයුතු කළ නීතීඥ ශිරාල් ලක්තිලක මහතා ජනාධිපති උපදේශක ලෙස අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් පත්කරන ලද්දේය.

මාතර රාහුල විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබූ ශිරාල් ලක්තිලක මහතා විද්‍යාලයීය කොළඹ ආදි ශිෂ්‍ය සංගමයේ හිටපු ලේකම් වරයා ද වේ. කොළඹ ආදිශිෂ්‍ය සංගමයේ අඛණ්ඩ වසර 3 ක් ලේකම් වරයා ලෙස ඉමහත් සේවයක් කර ඇති ශිරාල් ලක්තිලක--මහතා වර්තමානයේ දී ද ආදි ශිෂ්‍ය සංගමය තුල රැඳී සිටිමින් එයට තම සේවය ලබා දීමට කටයුතු කරනු ලබයි.

කොළඹ විශ්ව විද්‍යාලයේ නීති උපාධිය ලැබ නීතිඥයෙකු ලෙස වෘත්තීමය ජීවිතය ආරම්භ කළ අතර ගැටුම් අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ඇමරිකාවේ ෆිලඩෙල්ෆියාහි ආකේඩියා විශ්වවිද්‍යාලයෙන් හා ටෙම්පල් විශ්වවිද්‍යාලයෙන් ලබා ගත් ඔහු ජාත්‍යන්තර නීතිය, ජාත්‍යන්තර දේශපාලනය, මානව හිමිකම් හා කළමනාකරණ කටයුතු පිළිබද ජාත්‍යන්තර ආයතනය හා විද්‍යාල රැසකින් වැඩිදුර අධ්‍යාපනය ලබාගත් අයෙකි. 1994 වර්ෂයේ දී අධිකරණ හා ව්‍යවස්ථා කටයුතු පිළිබද අමාත්‍යාංශයේ උපාය මාර්ගික සහ පර්යේෂණ කමිටු සාමාජිකයකු ලෙස කටයුතු කළ ඒ මහතා නැවත 2000 වසරේ දී කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ උපදේශකවරයෙකු ලෙසින් හා 2002 වසරේ දී කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යවරයාගේ පුද්ගලික ලේකම්වරයා වශයෙන්ද කටයුතු කළේය. .

නීති වෘත්තීය විෂය පථය තුළ ඔහුගේ වැඩි අවධානය යොමු වූයේ සිවිල් නීතිය, පරිපාලන නීතිය හා මානව හිමිකම් පිළිබදව ය. ශිරාල් ලක්තිලක මහතා බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු ලෙස 2011 සිට 2013 දක්වා කටයුතු කර ඇති අතර ඒ මහතා ග්‍රාම චාරිකා වැඩසටහන සහ පුරවැසි ක්‍රියාකාරීත්වයන් වෙනුවෙන් කැප වුණු දූෂණ විමසුම සංවිධානයේ පුමුඛයෙකු ලෙස ද කටයුතු කළේය. මාදුලුවාවේ සෝභිත හිමියන්ගේ ප්‍රධානත්වයෙන් ගොඩනැගුණු සාධාරණ සමාජයක් සදහා වූ ජාතික ව්‍යාපාරයේ පුරෝගාමී කාර්යභාරයක් ද ඒ මහතා විසින් ඉටු කරනු ලැබී ය.

**2018 ජූලි මස කලාපය සංස්කාරක විසිත්ත රංගන මහතා විසින් රාහුල ආදිශිෂ්‍ය කොළඹ සංගමයේ සභාපති රියර් අද්මිරාල් සරත් මොහොට්ටි මහතා වෙත පිළිගන්වමින්**



## රොහාන් සෝමවංශ මහතා, ආසියානු අලෙවිකරණ සම්මේලනයේ සභාපති ධුරයට



ජ්‍යෙෂ්ඨ අලෙවිකරුවකු සහ ආයතනික කළමනාකරුවකු වන, රොහාන් සෝමවංශ මහතා නිතරගයෙන් ආසියානු අලෙවිකරණ සම්මේලනයේ (AMF) 2018-2020 යන කාල පරිච්ඡේදය සඳහා සභාපතිධුරයට තේරී පත් විය. ඒ චීනයේ ගුවැන්ෂු අගනුවර පැවැති සම්මේලනයේ වාර්ෂික හමුවේදීය.

රාහුල විද්‍යාලයේ ආදී ශිෂ්‍යයකු වන ඔහු මේ වන විට පාවහන් ලොවේ නමක් දිනූ සැම්සන් වෙළඳ සමූහයේ සහ Globe Knitting (Pvt) Ltd යන ආයතන තුල අධ්‍යක්ෂ වරයකු ලෙසත්, අලෙවිකරණ හා ආයතනික සන්නිවේදන අංශ ප්‍රධානී ලෙසත් කටයුතු කරනු ලබයි. එමෙන්ම ඔහු රාහුල විද්‍යාලයීය කොළඹ ආදි ශිෂ්‍ය සංගමයේ ක්‍රීඩා සමාජයේ වර්තමාන සභාපති වරයාද වෙයි.

## වාර්ෂික සාමාජික දිනය බුද්ධදාස ක්‍රීඩාංගනයේ දී

රාහුල විද්‍යාලයීය කොළඹ ආදී ශිෂ්‍ය සංගමයේ ක්‍රීඩා සමාජය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන සාමාජික හා ක්‍රීඩා දිනය 2018 දෙසැම්බර් 01 වන සෙනසුරාදා පෙරවරු 9.00 සිට පස්වරු 6.00 දක්වා බත්තරමුල්ල බුද්ධදාස ක්‍රීඩාංගනයේ දී උත්කර්ෂවත් ලෙස පැවැත්වීමට මේ වන විට සියලු කටයුතු සුදානම් කොට ඇත.

ඒ සඳහා සහභාගී වන පවුලේ සාමාජිඔබට සහකයන්ට අවශ්‍ය ආහාර පාන නොමිලේ සැපයෙන අතර අවුරුදු 12 ට අඩු සියලුම දරුවන් සඳහා ත්‍යාගයන් ලබා දීමට සංවිධායක මණ්ඩලය කටයුතු සුදානම් කොට ඇත.




**වැඩිදුර තොරතුරු සඳහා පහත සඳහන් අංක අමතන්න.**

**0777 316 730 ජයරත්න**

**0777 900 214 වෙත්තසිංහ**

### *Educationist par Excellence*

# Gurudeva Gunapala Wickremaratne



It was, reportedly, the most turbulent period of time for the well known school, Ananda Sastralaya, Kotte. That was almost immediately after the schools take over by the government on January 01st 1961. It was no sooner the highly respected Dr. E. W. Adikaram retired as Principal. Students became unruly with arrogant conduct, ignoring tradition, violating rules and disobeying the Acting Principal and the teaching staff. On several occasions students lit crackers in the compounds, and damaged the property of the school, and even disrupted the teaching in class rooms. Parents defended their children for reasons known only to them.

Authorities in the Education Department kept changing the Head of the School a few times, but with no success, and ultimately decided to appoint a Principal through an advertised interview. The interview board made an uncompromised decision to select a well experienced, strict disciplinarian as a no-nonsense Principal, who could rebuild the school to the former glory that prevailed earlier for many decades. There were five candidates, one of whom was Mr. Gunapala Wickremaratna, who passed away recently at the age of 92 years.

Six-foot tall, sturdy looking, smartly attired Gunapala Wickremaratne impressed the board with straightforward responses to prove his capacity, skills and vision to meet the situation, as required, to calm down the students and restore law and order in the school to the levels it should be.

He knew the imminent tasks ahead of him, and he was ready to deliver. On the day Principal Gunapala Wickremaratne assumed duties, student leaders lit crackers supposedly to frighten him, deflated two tyres of his car and started making various noises in the classrooms in the vicinity of the Principal's Office. Principal started the day with a brief meeting with the Academic Staff to introduce himself and to ask for cooperation, emphasising that his foremost business is to bring everything under control. Then he summoned all the students to a Students Assembly. He started his address by thanking students for welcoming him with crackers, at which the students were dumbfounded at first and then they at once erupted in to a thundering applause that lasted a few seconds, and the new Principal thanked them again with his phenomenal broad smile, and the students became calm and self-restrained and appeared to admire the attitude of the new Principal. Mr. Wickremaratne, the clever strategist he was, further reconciled all student-based issues in his new school with another innovative step by assigning new responsibilities to the students and his Teaching Staff. He pioneered the Junior Cadet Corp of the School, organized nine Student Societies, prioritized support for all sports and recruited a Cricket Coach, while personally supervising the sustenance and the progress of all such activities. All in all, in 1965, when Mr. Wickremaratne was moved to become the Principal of Nalanda College, Colombo, the entirety of the student population of the school and the Parent-Teacher community lodged a massive protest against the transfer, but with no avail.

At Nalanda, from 1965 to 1969, he did a splendidly yeoman's service guiding the future of many thousands of students, who today are the champions of their many different professions - both in their motherland and overseas. In remarkable unison, they displayed their gratitude, respect and veneration in no small measure to their Guru, when they participated magnanimously at the funeral of their beloved Principal, making it an all-time memorable event.

Former EducationMinister I. M. R. A. Iriyagolla, in his wisdom took Mr. Wickremaratna off Nalanda and made him the Principal of the first-ever Junior Technical College in his own Kuliyapitiya Electorate. Then onwards, there was no looking back for this remarkable and most willing educationist, Mr. Gunapala Wickremaratna, for his dedication and commitment to serve the country and its people, with undisputed focus on the wellbeing of the student population.

Thus he was honoured by every government in power from time to time by offering him some of the most responsible positions in the country's administrative structure such as Principal - Polytechnical Colleges in Maradana and Galle, Director of Education, Commissioner of Examinations, Deputy Director General of Education and Chairman of Educational Service Commission.

Parents of young Gunapala Wickremaratne, both of whom were teachers, guided their son towards highest echelons in learning by admitting him to Mahinda College, Galle. At Mahinda, the young prodigy unequivocally received a solid foundation to build up his future character, for which he showed tremendous gratitude and utmost respect, when referring to his alma mater in Galle, while reminiscing memories during his days of retirement.

After some years at Mahinda, he decided to join Rahula College, Matara. When he came before Rahula Principal, Mr. D. J. Kumarage for the interview to enter Rahula, he asked why the young man wished to leave Mahinda and join Rahula, at which he had at once said 'Sir, I like to receive higher education'. With a smile Mr. Kumarage had said, "It is an honour to have you in Rahula, coming here for higher education from Mahinda.", and Wickremaratne truly received higher education at Rahula, having successfully getting through the 1943 Senior School Certificate Examination and two years later entering the University of Ceylon as one of the first batch undergraduates of the new University.

Having graduated from the University, Gunapala Wickremaratne came back to Rahula as a teacher and having equipped with many more academic qualifications, he rose to be a Vice Principal of Rahula up to 1961, before joining Ananda Sastralaya.

His wife Vineetha - a retired school teacher herself, the two sons - Ajith and Dharman, the three daughters - Medha, Sardha and Mahidha - and their spouses - all proven professionals in their respective fields, are leading the large network of those bereaving the loss of their close relative, true friend and trusted colleague in Gurudev Gunapala Wickremaratne. In the words of William Shakespeare, the Bard of Avon -

*"His life was active*
*And the elements so elegant in him*
*That all those who knew him would*
*Bow their heads and say to all the world*
*'He was a Great Man'*

And, Mr. Gunapala Wickremaratne, my beloved teacher at Rahula, was a Great Man, indeed. May he attain the supreme Bliss of Nirvana.

Lal Hewapathirana

# මතකයෙන් බිඳක්......

මගේ මතකය කෙමෙන් කෙමෙන් අතීතය වෙත දිවයයි... ගුණතිලක ශාලාවේ මුල්ලක හිච්චි කාමරයක්... එයට සන්නිවේදන කවය යැයි කියයි. බඩු වලට වඩා වැඩ තමයි...

ප්‍රවේශය...රහල් කථිකයින්ගේ වාග් චාතුර්යයේ ඔද තෙද වඩනා ප්‍රවේශය... නිර්මාණකරණයට නව නැම්මක් කථික හා විවාද සංගමයේ නිර්මාණයක් හයේ පන්තියේ සිට දහතුන පන්තිය දක්වා ඇති ශ්‍රේණි අටෙන් තෝරාගත් රහල් සිසුවෙක් මනාකොට තම කථිකත්වය මෙහෙයවයි... ජාතික වීරයෝ, පරිසරය සුරකිමු, අනාගතයේ අපිට ඇති අභියෝග, මාතෘකා අතර වෙයි... කථනය මිනිත්තුවක් හෝ දෙකක් වෙයි. මුළු රාහුලයටම හඬගා කියයි.

අහා.... කෙතරම් අභිමානයක් ද?

කරලිය, සඟරාමය විශේෂාංගය... පූර්විකාව... කරලිය, නිර්මානකරණට අත්වැලක්... සිංහල මහා සංගමයේ වැඩක්. හයේ පන්තියේ සිට දහතුන පන්තිය දක්වා ඇති ශ්‍රේණි අටෙන් තෝරාගත් මනරම් ගද්‍ය, පද්‍ය නිර්මාණ තුල මුළු රාහුලයම මොහොතකට ගිලී යයි.. වැල නොකැඩී නිර්මාණ ගලා එයි. කුමක් තෝරා ගන්නේදැයි යන පැනය නැගෙයි. එතරම්ම අනර්ග වූ නිර්මාණයන් රහල් පුතුන්ගේ පන්හිකෙෂන් ලියැවේ...

අහා.... කෙතරම් අභිමානයක්ද?

මෙවැනි සොඳුරු සිතුවම් කෙතරම් තිබිණිද? එතරම්ම ස්නේහයක්, ලබැදියාවක් අදටත්  හදට දැනේ.

ඉදින්, මේ වෑයම එදා ඇත, අද නැත යන්න කීමට නොවේ...

එදා ඒ ලැබූ පන්නරය අදටද කඳ කෙලින් තබාගෙන ක්‍රියා කිරීමට මග තැනුවා යන්න කීමටය.

රාහුලය අද මෙන්ම එදාද, එදා මෙන්ම අදද ප්‍රබුද්ධ තරුණ පරපුරක් බිහිකිරීම සඳහාවන දකුණු ලක තක්සලාවයි... තක්සලා යන නම ඇසුණු සැනින් දිසාපාමොක් අදුරු වෙත සිත දිවයන්නේ යම්සේද මා පාසැල් මෑ□ මතක්වන සැනින් සිත දිවයන්නේ, මාතෘ සෙනෙහසින්, පීතෘ සෙනෙහසින් අපි වැනි නාඹර කොලු ගැටයන් පෝෂණය කළ දිසාපාමොක් පරපුරේ ඇදුරු උත්තමයන් වෙතයි. මම, ඔබ, අප, රාහුලය, අද යම් තැනක වේද ඒ තැනේ නිමවුම් කරුවා වන්නේ යටගියාවෙහි අනූ පස් වසක් තුල සාරගර්භ පරපුරක් ලකඹරට දායාදකරදුන් දයාබර ගුරු මව්වරුන්, ගුරු පියවරුන් ම වේ... එයට අටුවා ටීකා ටිප්පනි නොවුවමනාමය.....

කලට යලට බිජුවට වපුරා රහල් රඟමඩල අස්වැද්දූ සේනේබර ගුරුමවුනි, ගුරුපියනි මේ ස්නේහයේ වදන් ඔබගෙයි... ඔබටමයි....

තෙරුවන් සරණයි...

කසුන් මංජුල ආරියදාස

# වාර්ෂික විනෝද චාරිකාව



මෙවර වාර්ෂික විනෝද චාරිකාව තෙදින එකක් වූ අතර, සැප්තැම්බර් මස 22, 23 සහ 24 යන දිනයන් ඒ සඳහා යොදාගෙන තිබුණි. සුන්දර වෙරළ තීරයක් සහිත ත්‍රිකුණාමලය ප්‍රදේශය අපගේ ගමනාන්තය විය.

චාරිකාව සඳහා අප සංගමයේ සාමාජිකයින් සමග ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් ද ඇතුළුව පනස් දෙදෙනෙකු (52) සහභාගී විය. මෙහි සංවිධාන කටයුතු සුභසාධක සංගමයේ ලේකම් චන්දන ගමගේ මහතා සහ සංවිධායක, ටී ජේ ජයරත්න යන මහත්වරුන් විසින් සිදු කෙරිණි.

යොදාගත් පරිදි සැප්තැම්බර් මස 21 දින රාත්‍රී 11.00 ට නුගේගොඩ නමස්තේ අසලින් පිටත් වූ බස් රථය උදෑසන 5 පමණ වන විට ත්‍රිකුණාමලයේ අප නවාතැන් සඳහා වෙන් කරන ලද ලෝටස් පාර්ක් හෝටලයට ළඟා විය.

සියලු දෙනාම පැමිණ මදක් විවේක ගැනීමෙන් අනතුරුව සලසුම් කරගත් පරිදි, ප්‍රථමයෙන් ම සේරුවාවිල විහාරය වැඳ පුදා ගැනීම සඳහා පිටත් වූහ. එලෙස සේරුවාවිල පුදබිම වන්දනා කර ගැනීමෙන් පසු කොනේශ්වරම් පුදබිම වෙත පිටත් වූහ. ඉන් පසු නැවතත් නවාතැන් ගෙන සිටි හෝටලයට පැමිණි අපි රාත්‍රී භෝජන සංග්‍රහය සඳහා සහභාගී වීමු. මෙලෙස ආගමික කටයුතු සඳහා මුල්තැන දෙමින් චාරිකාවේ පළමු දිනය නිමා විය.

චාරිකාවේ දෙවෙනි දිනය යොදාගෙන තිබුණේ පරෙවි දූපත (The Pigeon Island) නැරඹීමටයි. නාවික හමුදාවේ ද, සහය ඇතිව බෝට්ටු මගින් සියල්ලෝම පරවී දූපත දැක බලා ගනිමින් විනෝද වූහ. එහිදී රියර් අද්මිරාල් සරත් මොහොට්ටි මහතාව නාවික හමුදා නිළදාරින් විසින් ඉතා ඉහලින් පිළිගනු ලැබිණි.

එදින රාත්‍රියේ, ත්‍රිකුණාමලය වරාය පරිශ්‍රය තුළ අප වෙනුවෙන් රාත්‍රී භෝජන සංග්‍රහයක් පිළියෙළ වූ අතර, මධ්‍යම රාත්‍රිය වන තුරුම නැටුම් ගැයුම් වැයුම් සපිරි සංගීත සැඳෑවක මිහිරියාව විඳ ගැනීමට ද අවකාශය සැලසුණි.

චාරිකාවේ අවසාන දිනය වන තෙවැනි දිනයේදී යොදාගත් පරිදි ත්‍රිකුණාමල වරාය නැරඹීම සඳහා පිටත් වීමු. එහිදී උදෑසන ආහාරය ලබා ගැනීමෙන් පසුව ප්‍රථමයෙන් වරාය කෞතුකාගාරය නැරඹීමට ගියෙමු.

පසුව ඉතා දුර්ලභ අවස්ථාවක් වන නාවික හමුදාවට අයත් යුධ නෞකාවකට පිවිසී එය දැක බලා ගැනීමට හැකියාව ලැබුණි. මෙම අවස්ථාව ලබාදීම වෙනුවෙන් සභාපති රියර් අද්මිරාල් සරත් මොහොට්ටි මහතා ට විශේෂ ස්තුතියක් පිරිනැමිය යුතුය. වරායේ නවතා තිබු නාවික හමුදාව සතු දිගම නෞකා වන සයුරළ සහ සයුර යන නෞකා දෙක තුලටම ගොස් ඒවා සියැසින් දැක බලා ගැනීමේ හැකියාව ලැබුණි. එහිදීද රියර් අද්මිරාල් සරත් මොහොට්ටි මහතා ඇතුළු අප සියලු දෙනා ඉතා ඉහලින් නෞකාව වෙත ඇතුළු වීමේදී පිළිගනු ලැබිය.

ඒ අයුරින් සොඳුරු තෙදිනක අවසානයේ, අප ජීවිතවලට නොමැකෙන මතක සටහන් ගොන්නක් එක් කර ගනිමින් නැවතත් අපි කොළඹ බලා ඒමට පිටත් වීමු.











# සුව දිවියකට හොඳම ඔසුව ව්‍යායාමයි



මිනිස් සත්වයාගේ සිරුරු සෑදී ඇත්තේ ඇඟ වෙහෙසා වැඩකර තමන්ගේ ජීවිතය රැක ගැනීමටය. තාක්ෂණයේ දියුණුවත් සමග මිනිසා වැඩිපුර මොළය වෙහෙසා වැඩ කරන අතර කය වෙහෙසා වැඩ නො කිරීම තුල අලුතින් ගැටලු රාශියක් උද්ගතවී ඇත. බෝ නොවන රෝග ලෙස හඳුන්වන දියවැඩියාව, අධික රුධිර පීඩනය, කොලොස්ටරෝල් වැඩිවීම, ස්ථුලතාවය, සන්ධි රෝග ඉන් කිහිපයක් වන අතර, ලංකාවේ දිනකට සිදුවන මරණ වලින් සියයට 60 ක් පමණ ඇතිවන්නේ එම රෝග හේතුවෙනි.

වැඩිහිටියන්ට පමණක් නොව කුඩා ළමුන් හා තරුණ වයසේ පසුවන දරුවන් ද කායික ක්‍රීඩා අඩුවීම හේතුවෙන් බෝ නොවන රෝග වලට මෙන් ම, ශාරීරික වර්ධනයේ ගැටළු වලට මුහුණ දෙමින් පවතී. මෙම තත්වයන්ගෙන් වැලකීමට හැකි හොඳම ක්‍රමය වන්නේ ව්‍යායාම කිරීම යි. ව්‍යායාම මගින් අපගේ සිරුරට බොහොමයක් වාසි ලැබේ. ඒ අතර පේෂි වලට ශක්තිය ලැබීම, ක්‍රියාශීලිත්වය, සිරුරට ප්‍රියමනාප හැඩයක් ලබාගැනීම, මානසික ආතතිය අඩු වීම, බෝ නොවන රෝග මෙන්ම, බෝ වන රෝගවලට ඔරොත්තු දීමේ හැකියාව වැඩිවීම වැනි බොහොමයක් ප්‍රතිලාභ ලැබෙයි. කුඩා දරුවන් ව්‍යායාම කිරීමෙන් අස්ථි, පේෂි ශක්තිමත්ව වර්ධනය වීම මෙන්ම ජාන වලින් තීරණය වූ උපරිම උස ලබාගැනීමටද හැකියාව ලැබේ.

ඉහත කී ප්‍රතිලාභ ලබාගැනීමට, විධිමත් ලෙස නිතිපතා ව්‍යායාම කිරීම අවශ්‍ය වෙයි. වයස අවුරුදු 16 දක්වා ළමයින් දිනකට විනාඩි හැටක ව්‍යායාම පුරුද්දක් වශයෙන් ලැබීම ළමයාගේ නිරෝගී වර්ධනයට උදව් වන අතර, වැඩිහිටියන් අවම වශයෙන් සතියකට විනාඩි 150ක් පමණ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යායාම කළ යුතුය.

ව්‍යායාම කිරීමෙන් ශාරීරික යෝග්‍යතාව වර්ධනය වන අතර, යෝග්‍යතාවය වැඩිවීමෙන් තමන්ගේ එදිනෙදා කාර්යයන් කාර්යක්ෂමව, දීර්ඝ කාලයක් කළ හැකිය. මෙය ප්‍රීතිමත් ජීවිතයකට අත්‍යවශ්‍ය දෙයක් ලෙස සැලකේ. ශාරීරික යෝග්‍යතාවය වර්ධනය කිරීමේදී නිරෝගී බව රැක ගැනීම වෙනුවෙන් දියුණු කළයුතු ශාරීරික යෝග්‍යතා ලක්ෂණ ලෙස හෘද වස්තුව සහ පෙණහළු ආශ්‍රිතව දරාගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම, ශරීරයේ මේදය දහනය කිරීමෙන් නිරෝගී ශාරීරික බරක් පවත්වා ගැනීම, පේෂි වල ශක්තිය මෙන්ම දරාගැනීමේ හැකියාව වර්ධයන කර ගැනීම, නම්‍යශීලිත්වය වැඩි දියුණු කර ගැනීම යන ගුණාංග ඇතුලත් වේ.

මෙම ගුණාංග දියුණු කිරීමට විවිධ වර්ගයේ ව්‍යායාම කළ යුතුය. උදාහරණයක් ලෙස හෘද වස්තුව සහ පෙනහැලි ආශ්‍රිතව දරාගැනීමේ හැකියාව වැඩි දියුණු කරගැනීම මෙන් ම සිරුරේ මේදය දහනය වී ශරීරයට හොඳ බරක් ලබා ගැනීමට කළයුතු ව්‍යායාම වන්නේ ස්වායු ඝනයේ ව්‍යායාම යි.

ස්වායු ඝනයේ ව්‍යායාම සඳහා උදාහරණ වන්නේ ඇවිදීම, දිවීම, බයිසිකල් පැදීම, පිහිනීම සහ ස්වායු නර්ථන ව්‍යායාම වැනි ව්‍යායාමයි. මෙම ව්‍යායාම කිරීමේ දී ද උපරිම ප්‍රතිඵල ලබා ගැනීමට නම් හොඳ තීර්ව්‍රතාවයකින් මෙම ව්‍යායාම කළ යුතුය. තීර්ව්‍රතාවය සාමාන්‍යයෙන් මැන බලන්නේ හෘද ස්පන්දන වේගය නොහොත් නාඩි වේගය මැන බැලීමෙනි. තීර්ව්‍රතාවය මැන බැලීමට පහත සඳහන් ක්‍රමය යොදාගත හැකියි.

යම් කිසි පුද්ගලයෙකුට ශරීරයට හානියක් නොවී යාහැකි උපරිම හෘද ස්පන්දන වාර ගණන පළමුව ගණනය කළ යුතු ය. ඒ සඳහා 220 අගයෙන් තමාගේ වයස අඩු කළ යුතු ය. උපරිම හෘද ස්පන්දන වේගයෙන් සියයට 80 ක් ම වැඩි හෘද ස්පන්දන වේගයක් පවත්වා ගනිමින් කරන ව්‍යායාම අධික තීර්ව්‍රතාවයෙන් යුක්ත ව්‍යායාම ලෙස හඳුන්වන අතර උපරිම ස්පන්දන වේගයෙන් 60% - 80% දක්වා හෘද ස්පන්දන වේගයක් පවත්වා ගනිමින් කරන ව්‍යායාම මධ්‍යම ප්‍රමාණයේ තීර්ව්‍රතාවයෙන් යුක්ත ව්‍යායාම ලෙස හඳුන්වයි.



වෛද්‍ය ලාල් ඒකනායක - ක්‍රීඩා සහ ව්‍යායාම වෛද්‍ය

උපරිම හෘද ස්පන්දන වේගය 60% කට අඩු ප්‍රමාණයක හෘද ස්පන්දන වේගයන් පවත්වා ගනිමින් කරන ව්‍යායාම අඩු තීර්ව්‍රතා ව්‍යායාම ලෙස හඳුන්වයි. ව්‍යායාම කරන පුද්ගලයෙකුට වැඩිම ප්‍රතිලාභයක් ලබා දෙන්නේ මධ්‍යම ප්‍රමාණයේ තීර්ව්‍රතා ව්‍යායාම හෝ වැඩි තීර්ව්‍රතා ව්‍යායාම මගිනි. උදාහරණයක් ලෙස වයස අවුරුදු 20 පුද්ගලයකුගේ උපරිම හෘද වස්තු වේගය වන්නේ 220 * 20 - 200

එම පුද්ගලයාගේ වැඩි තීර්ව්‍රතා අගය වන්නේ 200 * 80% = 160 සිට 200 වන අතර මධ්‍යම ප්‍රමාණයේ හෘද ස්පන්දන වේගය වන්නේ 120 * 160 දක්වා වේ. අඩු තීර්ව්‍රතා හෘද ස්පන්දන වේගයකි. මධ්‍යම ප්‍රමාණයේ සහ වැඩි තීර්ව්‍රතාවයේ ව්‍යායාම කිරීමට වෛද්‍ය උපදෙස් ලබාගෙන සුදුසු තීර්ව්‍රතාවයකින් ව්‍යායාම කළ යුතුයි.

ශාරීරික යෝග්‍යතාව වැඩිකර ගැනීමට ව්‍යායාම කිරීමේදී, ස්වායු ගණයේ ව්‍යායාම වලට අමතරව අනිවාර්යයෙන්ම පේෂි ශක්තිමත් කිරීමේ ව්‍යායාම මෙන්ම නම්‍යශීලිත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යායාම කිරීම ද අනිවාර්ය.

පේෂි ශක්තිමත් කිරීමේ ව්‍යායාම කිරීමට තමාගේ සිරුරේ බර උපයෝගී කරගෙන ව්‍යායාම කිරීමට හැකිය.

උදාහරණයක් ලෙස ස්කොට් (Squat) සහ Push up ව්‍යායාම හැඳින්විය හැකිය.

ඊට අමතර බර ඉසිලීමේ ව්‍යායාමද සිදුකල හැකි ය. බර ඉසිලීමේ ව්‍යායාම සිදු කරන විට නිවැරදි තාක්ෂණික ඉරියව් භාවිතා කිරීම අනිවාර්ය වේ.

ව්‍යායාම කිරීමේදී ව්‍යායාම සඳහා සුදුසු ඇඳුම්, සහ සපත්තු භාවිතා කිරීමෙන් ආරක්ෂාකාරීව දිගු කලක් ව්‍යායාම සිදුකල හැකි ය. මීට අමතරව ව්‍යායාම වලට පෙර ඇඟ උණුසුම් කිරීමේ ව්‍යායාම සිදුකල යුතු අතර, ව්‍යායාම වලින් පසු ඇඟ සිසිල් කිරීමේ ව්‍යායාම සිදුකල යුතුය. විවිධ රෝගාබාධ වලින් පෙළෙන්නන් වෛද්‍ය උපදෙස් අනුව ව්‍යායාම කල යුතු ය.

හොඳින් නිතිපතා ව්‍යායාම කිරීමෙන් සහ පෝෂ්‍යදායි අහාර වේලක් ලබා ගැනීමෙන් නිරෝගී, ජව සම්පන්න සිරුරක් ලබා ගත හැකි ය.

වෛද්‍ය ලාල් ඒකනායක ,
ක්‍රීඩා සහ ව්‍යායාම වෛද්‍ය.

## කතු වැකිය

# දේශපාලනය

විවිධ වූ දේශපාලන මති මතාන්තර බොහොමයක් මේ මොහොත වනවිට කරලියට පැමිණ ඇත. තමන් විසින් කැමැත්තක් හදාගෙන එම කැමැත්ත ඉෂ්ට වූ විට එයට ඇලී හුරේ දාන්නත්, කැමැත්ත ඉෂ්ට නොවූ විට එයට ගැටී ද්වේශයෙන් පුපුරන්නත් ලෝක සම්මතයේ නුගතුන් මෙන්ම උගතුන් ද, ධනවතුන් මෙන්ම දුප්පතුන්ද, තරුණයින් මෙන්ම වැඩිහිටියන්ද, පිරිමින් මෙන්ම කාන්තාවන් ද, පෙළඹී ඇති මහා බේදවාචකයක තරම...

මෙහිදී මොහොතකට එදා හෙළදිව තිබුණු රාෂ්ට පාලනය පිළිබඳ සොයාබැලීම වටී

ඉස්සර ලංකාවේ, ඒ කියන්නේ කෝටි පහක ජන ප්‍රමාණයක් සිටිය කාලෙත්, රන් අබරණින් සැරසුණු කාන්තාවකට ලංකාවේ එක කොනක ඉඳල අනිත් කොනට යන්න හැකියාවක් තිබිල තියනවා. රාෂ්ට පාලනය මේකට හේතුවෙලා තියනවා.රාෂ්ට පාලනය කියන්නේ රජතුමා ඇතුළු කාණ්ඩ අටකින් යුත් පාලන ක්‍රමයක්.

එක ගෙදරක පස් දෙනක් ඉන්නවා කියල ගත්තොත් කෝටි පහක ජනගහනයක් තිබුන ලංකාවේ ගෙවල් කෝටියක් තියෙන්න ඕන. දැන් මේ ගෙවල් දහයට එක නායකයෙක් ඉන්නවා. පත්තුවේ නායකයා කියල. මේ නායකයට අර ගෙවල් දහයම යටත්. ඕන වෙලාවක පරීක්ෂා කරන්නත් පුළුවන්. මේ විදියට ගෙවල් කෝටියට පත්තුවේ නායකයින් දස ලක්ෂයක් ඉන්නවා ඔවුන්ගේ රැකියාව උනේ ඒ ගෙවල් පරීක්ෂා කර සියලු දේ සටහන් කිරීමයි. ඒ ගෙවල් දහයේ තියෙන සියලු වත්කම් ඒ නායකයා දැනගත යුතුයි කාටවත් කිසිවක් හංගන්න බෑ හැන්ගුවොත් රාජ්‍ය විරෝධියි. රජය දැනුවත් වත්කම් තියාගන්න අවසර තියනවා. රාජ්‍ය විරෝධී නොවන සමාජ විරෝධී නොවන ගැලපෙන දේවල් පරිහරණය කරන්න පුළුවන්. හැබැයි මේ සියලු දේවල් පත්තුවේ නායකයා දැනගෙන ඉන්න ඕන. ගෙදර කීදෙනෙක් ඉන්නවද, නම් ගම මොනවාද. ඔවුන් කරන රක්ෂා මොනවාද. ආදී සියලු දේ සටහන් කර ගන්නවා. මේ ගෙවල් වලට පිටින් කවුරුහරි ආවත් පත්තුවේ නායකයා දැනගන්නවා. ඒ ඔහු ඉන්නෙත් මේ ගෙවල් දහය ලඟම නිසා ඔහු නිතරම මේ ගෙවල් පරීක්ෂා කරනවා. එක තමයි ඔහුගේ රැකියාව. ඒ නිසා රාජ්‍ය විරෝධී දේවල් කරන්න ඉඩ කඩ නෑ

දැන් මේ පත්තු නායකයින් දහ දෙනෙක් බලාගන්න එක නායකයා බැගින්, පත්තු නායකයින් ලක්ෂය බලාගන්න ඊට ඉහල මට්ටමේ නායකයින් ලක්ෂයක් පත් කරනවා. පත්තු නායකයින් තමන්ට ඉහලින් උන්න නායකයින්ට ඔවුන්ගේ සියලු වත්කම් අදායම් වියදම් දැනුම් දිය යුතුයි. හැම තිස්සෙම එක නායකයකුටම බලාගන්න තියෙන්නේ ගෙවල් දහයක් නිසා ඔවුන්ට අපහසුවකින් තොරව රාජකාරිය කරන්න පුළුවන්. දැන් මේ ලක්ෂය බලාගන්න තව දස දහසක් නායකයින් පත් කරනවා. මේ නායකයින් දස දහස බලාගන්න ඊටත් ඉහලින් සහසක් නායකයින් පත් කරනවා. ඊටත් ඉහලින් නායකයෝ සියයක් පත් කරනවා. ඒ සියය බලාගන්න නායකයින් දහයක් පත් කරනවා. ඒ දහය බලාගන්න රජතුමා ඉන්නවා. ඔය විදියට කොටස් අටක පාලන ක්‍රමයක්.

මෙහිදී අද වගේ සංකීර්ණ බදු නෑ. හැබැයි ගෙදරක අදායමෙන් සියයට 20 ක් පත්තුවේ නායකයට දෙන්න ඕන. නායකයාට වැටුප් දෙන්නේ රජය නොවෙයි. ඒ නිසා නායකයා කැමති නෑ ගෙවල් දහයේ කට්ටිය කිසි වැඩක් නොකර නිකන් ඉන්නවට. ඒ නිසා නිෂ්පාදනය අඩාල වෙන්න ඉඩ නෑ . රට ස්වයංපෝෂිත යි. විදේශ විනිමය ඕන වුනේ නෑ . කාටවත් යටත් වුනේ නෑ . පත්තු නායකයා ඔහුට ලැබෙන අදායමෙන් සියයට 20ක් ඊට ඉහලින් ඉන්න නායකයට ගෙවනවා මේ ක්‍රමයට රජතුමා දක්වා පහලින් ඉන්න හැම කෙනෙක් ම සියයට 20 උඩින් ඉන්න නායකයට ගෙවනවා කාටවත් පැහැර ගන්න බෑ

උදාහරණයක් විදියට ගෙදරක අදායම රුපියල් 2000 ක් නම් ගෙවල් දහයේම අදායම රුපියල් 20000 යි. එතකොට නායකයාට රුපියල් 4000 ක් ලැබෙනවා. ඒකෙන් රුපියල් 800ක් ඔහු තමන්ගෙ නායකයාට ගෙවන්න ඕන. මේ විදියට රජතුමා දක්වා යනවා. ඒක තමයි සියලුම නායකයින් තමන්ගේ රාජකාරිය ඉටුකිරීමට ලැබෙන වැටුප. ඒක නිකන් ඉඳල ගත්ත එකක් එහෙම නෙවෙයි.

මේ ආකාරයෙන් කිසිම රජයක් දුශ්චරිතයට අනුබල දෙන්නේ නෑ. ඒ වගේ රටකට සමගිය උදාවෙන්නේ නිරායාසයෙන්.

රටක රජතුමා ඇතුළු මුළු පාලන තන්ත්‍රයම ධාර්මික වෙනවා නම් ඒ රටට සශ්‍රිකත්වය උදාවෙන හැටිත්, මනුෂ්‍යයන්ගේ ලෙඩ රෝග දුරු වෙලා දීර්ඝායුෂ ලබන හැටිත් බුද්ධ වන්දනාවේ මනාව සඳහන් වෙනවා.

බෞද්ධ පරිසරයක හැදුනු අපි මේ පිළිබඳව රාග ද්වේශ මෝහ සිත් ඉවතලා කටයුතු කිරීම වර්තමානයේ අවශ්‍යතාවයයි.


## රාහුල විද්‍යාලයීය කොළඹ ආදි ශිෂ්‍ය සංගමය

CME/001/08/NPO

STAMP

ATTANAN DAMAYANTI PANDITA

**ආපසු ලිපිනය**
ගරු ලේකම්,
ඩී පී වික්‍රමසිංහ,
අංක 100/19, වැලිකඩවත්ත පාර,
රාජගිරිය.

රාහුල RAHULA සිවු මාසිකය - 2018 අගෝස්තු - නොවැම්බර්

රාහුල විද්‍යාලයීය කොළඹ ආදි ශිෂ්‍ය සංගමයේ - නිල ප්‍රකාශනය

**සංස්කරණය** - විසිත්ත රංගන **ග්‍රෆික් සැකසුම** - අනුජ කාමන් වික්‍රමසිංහ **මුද්‍රණය** - ජයන්ත ඩයස් (සුපර්ග්‍රැෆික්ස්)